# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 ඔක්තෝබර් මස 04 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-09-20 වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/83)

අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහබෙල්ලන තොටුපල මාර්ගයේ මාර්ගයට හා අසල තාප්පවලට හානිදායක අයුරින් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මඟින් පස් කැපීමක් සිදුකර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ) එසේ නම් එම පස් ප්‍රාදේශීය සභාව කුමන කටයුතු සඳහා යෙදවූවේද?

ඇ) එම ක්‍රියාදාමයේදී අදාල මාර්ගයට හා තාප්ප වලට වී ඇති හානිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව මඟින් කිනම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

ඈ) නොඑසේ නම් මන්ද?

ඉ) එම මාර්ගයෙන් ලබා ගන්නා පස් අලෙවි කර තිබේද?

2 ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-09-20 වන දින අසන ලද ප්‍රශ්ණය.

(ප්‍ර/vi(1)/16/84)

අ) ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති විසින් අංක WP/CB/G/ED/2015/3/15/13 හා 2015 නොවැම්බර් 03 දිනැතිව විගණන විමසුමක් සිදු කර තිබේද?

ආ) එසේ නම් එය කුමන කරුණු පදනම් කර ගනිමින්ද?

ඇ) එම විගණන විමසුමේ නිර්දේශ මොනවාද?

ඈ) පාසලක වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරු කිරීමට එමගින් නිර්දේශ කර තිබේද?

ඉ) ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී එය ඇතැම් ගුරුවරුන්ට පමණක් සීමාවන පරිදි ක්‍රියාත්මක කර ඇති බවට තිබෙන තොරතුරු සත්‍යද?

ඊ) නොඑසේ නම් එම විගණන විමසුම් නිර්දේශ අදාළ සියලු ගුරුවරුන්ට ක්‍රියාත්මක කළේද?

3. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-09-20 වන දින අසන ලද ප්‍රශ්ණය.

(ප්‍ර/vi(1)/16/85)

අ) ගම්පහ දිස්ත්‍රික්කයේ හේනෙගම මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසැලක් පවතින්නේද?

ආ) i. එම විද්‍යාලයේ වත්මන් විදුහල්පතිවරයාගේ නම කුමක්ද?

ii. එම තනතුරට පත්වීම සඳහා ඔහුට සුදුසුකම් ප්‍රමාණවත්ද?

ඇ) එම විද්‍යාලයේ 10 වන වසරේ පන්ති කොපමණ ප්‍රමාණයක් පවතින්නේද?

ඈ) එම 10 වන වසරේ එක් එක් පන්තිවල දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

4. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-09-20 වන දින අසන ලද ප්‍රශ්ණය.

(ප්‍ර/vi(1)/16/86)

අ) බස්නාහිර පළාත තුළ ගුරු ස්ථාන මාරු සිදුවන්නේ "ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට" අනුවද?

ආ) එම ස්ථාන මාරු විධිමත්ව හා විනිවිදභාවයෙන් සිදුකරන බවට තහවුරු කරන්නේද?

ඇ) බස්නාහිර පළාත තුළ හා කලාප තුළ ගුරු ස්ථාන මාරුවීම් සිදුකිරීමේ බලතල පවරා ඇත්තේ කාටද?

ඈ) ඒ අනුව නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ට ස්ථානමාරු කිරීමේ බලතල හිමිවන්නේ කෙසේද?

ඉ) පිළියන්දල අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරිය තම බලතල අභිබවා ස්ථාන මාරුවීම් සිදුකරමින් ඇති බව ඔබ දන්නෙහිද?

ඊ) මෙබඳු ක්‍රියා සම්බන්ධයෙන් ඔබගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

5. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම,ඉඩම් වාරිමාර්ග,ධීවර,සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.

( ප්‍ර/vi(1)/16/87 )

(අ) 2016.09.08 සහ 2016.09.09 යන දිනයන් හි ඔබ අමාත්‍යාංශය මගින් හෝමාගම විල්ප්‍රඩ් සේනානායක ක්‍රීඩාංගණයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලද්දේද? එම ප්‍රදර්ශනයට සහභාගී වූ ආරාධිතයින් කවුරුන්ද?

(ආ) එම ප්‍රදර්ශනයට ප්‍රචාරක කටයුතු සඳහා වැය වූ මුදල් ප්‍රමාණය කොපමණද?

(ඇ) එම ප්‍රදර්ශනයට වැය වූ සමස්ත මුදල් ප්‍රමාණය කොපමණද?

(ඈ) කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වෙළඳ කුටි කීයක් එම ප්‍රදර්ශනයේදී පිහිටුවා තිබුණේද?

(ඉ) එම වෙළඳකුටි වල පැළ වර්ග කොපමණ ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන ලද්දේද? එම පැළ වර්ග අලෙවි කිරීමෙන් ලද ආදායම කොපමණද?

(ඊ) අලෙවි කිරීම සඳහා එම පැළ වර්ග ලබා ගන්නා ලද්දේ කුමන පුද්ගලයෙකුගෙන් හා / හෝ කුමන ආයතනයකින්ද?

6. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

( ප්‍ර/vi(1)/16/88 )

(අ) කොළඹ අධ්‍යාපන කලාප බල ප්‍රදේශයට අයත් ක්ලිෆ්ටන් බාලිකා විද්‍යාලය නමින් විද්‍යාලයක් පවතින්නේද?

(ආ) එම විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්නන් මේ දිනවල තාවකාලික මඩු වල අධ්‍යාපනය හදාරණ බව ඔබතුමා පිළිගන්නේද?

(ඇ) එසේ සිදුවී ඇත්තේ යාබද ඉඩමක කට්ටු නිවාසයක් ඉදිකිරීමට යාමේදී නිසි සැලකිල්ලකින් තොරව ඉදි කරන නීති විරෝධී ගොඩනැගිල්ලක් නිසා බව ඔබතුමා පිළිගන්නේද?

(ඈ) එම ගැටළුවට අදාළව පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

7. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

( ප්‍ර/vi(1)/16/89 )

(අ) i. බස්නාහිර පළාතේ ඔබ අමාත්‍යාංශය මගින් මෙතෙක් රෝහල් වලට ලබා දී ඇති ගිලන් රථ සංඛ්‍යාව කොපමණද?

ii. එය දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද?

iii. ගිලන් රථ ලබා දීමට අවශ්‍ය නමුත් මෙතෙක් ලබා නොදුන් රෝහල් තිබේද?

iv. ඒ කුමන රෝහල්ද?

(ආ) i. ධාවනය කළ නොහැකි ගිලන් රථ බස්නාහිර පළාත් සභා රෝහල් තුල තිබේද?

ii. එය කොපමණද?

iii. අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති ගිලන් රථ තිබේද?

iv. එය කොපමණද?

v. එය දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ඈ) i. අලුත්වැඩියා සඳහා යොමු නොකල රෝහල් තුල ගාල් කර ඇති ගිලන් රථ තිබේද?

ii. ඒ කුමන රෝහල් වලද?

iii. සංඛ්‍යාව කොපමණද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පොදු කටයුතු

01. ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමා විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය :

2016 අංක ---------- දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය :

(පළමුවර කියවීම)

[ බස්නාහිර පළාතේ පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා සන්නිවේදන කාර්යයන් විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා ද පද්ධති හා ක්‍රම විශ්ලේෂණය හා වර්ධනයත්, පරිගණක තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු විධිමත් හා පුළුල් කිරීම සඳහා ද තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා ද ඊට අනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, 2000 අංක 06 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා වූ ද ප්‍රඥප්තියකි. ]

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

1. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා :

සුදුසු නිවාසයක වාසය කිරීම ජනතාවගේ මානව අයිතිවාසිකම් ලෙසට ජාත්‍යන්තර විශ්ව ප්‍රකාශන වල පවා පිළිගෙන ඇත. ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාව දෙස බැලීමේදී සුදුසු නිවාසයක් තබා ජීවත්වීමට සරිලන අවම පහසුකම්වත් නොමැති නිවාස ජනතාවට ලබා දී ඇති බව බැලූ බැල්මට පෙනෙන කාරණයකි. එසේ නිවාස ලබා දී ඇත්තේ ඇතැම් අවස්ථාවලදී ඔවුන් ජීවත් වූ ස්ථිර භූමි භාග රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුවය. එසේ අත්පත් කර ගැනීමේදී කිසිදු ආකාරයක වන්දි මුදලක් එම ස්ථාන වලින් ඉවත් කළ ජනතාවට ලැබී නොමැත. ඔවුන්ට ලැබී ඇත්තේ කුලී නිවාස පදනම මත තට්ටු නිවාසය. ඒවායෙහි ජීවත්වීමට අවම පහසුකම් පවා නොමැති බව කිව යුතුය.

එසේ හෙයින් ඔවුන්ගෙන් ලබා ගත් භූමි භාගයන් සඳහා වන්දි මුදල් නොගෙවා ඇත්නම් සහ තට්ටු නිවාස වලින් නිවාස ලැබී ඇත්නම් ඒවායෙහි අය කරන කුලිය කපාහැරීමට කටයුතු කරන මෙන්ද ඉදිරියේදී අඩුම තරමින් වර්ග අඩි 750 ක පමණ නිවසක්වත් ජනතාවට ලබා දීමට කටයුතු කරන මෙන් ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි.

( යෝ/vi(1)/15/07)

2. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා ;

පසුගිය ආණ්ඩු සමයේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාළ ඉඩම් වල පදිංචිව සිටි තැනැත්තන් හට බොහෝ අවස්ථාවල වන්දි ප්‍රදානයකින් තොරව බලහත්කාරී ලෙස ඉඩම් අත්පත් කර ගැනීම් සිදු විය.

වත්මන් ආණ්ඩුව යටතේද එකී නරක පූර්වාදර්ශය ඉදිරියට යමින් කොළඹ මහ නගර සභාව ආශ්‍රිත වතු ඉඩම් රාශියක මෙන්ම පොදුවේ බස්නාහිර පළාත තුලම ඉඩම් අත්පත් කර ගැනීම් වන්දි ප්‍රදානයකින් තොරව සිදුවන බවට ජනතාවගෙන් මැසිවිලි නැගෙන අතර ඉහත තත්වය ඉඩම් අත්පත් කර ගැනීමේ අනපනත් අමු අමුවේ උල්ලංඝනය වීමක් වන අතරම ඉතා නරක පූර්වාදර්ශයක් ද වනු ඇත. එබැවින් වන්දි ප්‍රදානයකින් තොරව නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීම නොකළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කරයි.

( යෝ/vi(1)/16/01)

## XI. සභාව කල් තැබීම

ජේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.09.21 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.